B. Summary

Title :

ශ්‍රී ලංකාවේ පාසල් හා දෙමාපියන් අතර, සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

(හලාවත අධ්‍යාපන කලාපය ඇසුරෙන්)

Research Institute :

Faculty of Education, University of Colombo

Chief Scientific Investigator :

S.V.K.Gnanasaundari

Period of Contract :

Date of award : 27-02-1999

Date of completion 30-01-2001.

Scienfific Background and scope/Objectives of Project.

දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පාසල හා නිවස යන දෙකම එකසේ වැදගත් වේ. දරුවන් පාසලේදී ලබන අධ්‍යාපනය වඩාත් සාර්ථක වන්නේ ඔවුන්ට නිවෙස් පරිසරයෙන් ලැබෙන අනුබලය හා දිරිගැන්වීම අනුවය.

වර්ෂ 1992 දී නිකුත් කරන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව මඟින්ද පාසල් සම්බන්ධයෙන් දෙමාපිය සහභාගිත්වය අප්‍රමාදව ගවේෂණය කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ විරලය. එහෙයින් පාසල හා දෙමාපියන් අතර, සම්බන්ධතාව පිළිබඳව කෙරෙන මෙම පර්යේෂණය මඟින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට එළදායී මෙහෙවරක් කළ හැකි යයි අපේක්ෂා කෙරේ.

මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කළ අරමුණු කිහිපයකි.

1. පාසල හා දෙමාපියන් අතර සම්බන්ධතාවේ ස්වභාවය පිරික්සා බැලීම.
   1.1. දෙමාපියන් පාසලේ කටයුතු වලට වාර්ෂිකව සම්බන්ධ වන වාර ගණන, සම්බන්ධ වන අවස්ථා හා කාර්යයන් විමසා බැලීම.
   1.2. පාසල සමඟ වැඩියෙන් සම්බන්ධතා පවත්වන්නේ කවුරුන්දැයි (මව/පියා/භාරකරු) සොයා බැලීම.

1.3. පාසල සමඟ සම්බන්ධවන දෙමාපියන්ගේ ක්‍රියාකාරීත්වය පිරික්සා බැලීම.

1.4. පාසලේ සංවර්ධනයට දෙමාපියන්ගේ දායකත්වය කෙබඳුද යන්න පිරික්සීම.

2. පාසලේ දෙමාපිය සම්බන්ධතා කළමනාකරණ ක්‍රියා පිළිවෙත් සහ දෙමාපිය සහභාගිත්වයේ ස්වභාවය අතර සම්බන්ධය පිරික්සා බැලීම.

3. පාසල හා දෙමාපියන් අතර, සම්බන්ධතාව ශක්තිමත් කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග හඳුනා ගැනීම.

Experimental Method ;

සමීක්ෂණ පර්යේෂණ සඳහා වඩාත් යෝග්‍ය වන විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය මෙහිදී අනුගමනය කෙරිණි.

මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන ලද්දේ හලාවත අධ්‍යාපන කලාපය තුළ ය. එහි වූ පාසල් එකසිය හැට අටෙන් පාසල් වර්ගීකරණය පදනම් කරගෙන ස්ථරායන නියැදිකුමය අනුව පාසල් විස්සක් තෝරා ගැණිනි. එම පාසල්වල සේවය කළ ගුරුවරුන් දෙසිය දෙනෙකු සහ එම පාසල් වල සිසුන්ගේ දෙමාපියන් දෙසිය අසූ දෙනෙකු අහඹු ලෙස තෝරා ගන්නා ලදි. පාසල් විස්සේ විදුහල්පති වරුන්ද ඇතුළුව නියැදියට අයත් මුළු සංඛ්‍යාව පන්සියයක් විය. ගුරුවරුන් සහ දෙමාපියන්ගෙන් ප්‍රශ්නාවලි මඟින්ද විදුහල්පතිවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වී-මෙන්ද දෙමාපියන් සහභාගී වන අවස්ථා නිරීක්ෂණය කිරීමෙන්ද දත්ත රැස්කර ගන්නා ලදි.

පර්යේෂණයට ලක් වූ පාසල් වල දෙමාපියන්ගෙන් සහ ,ගුරුවරුන්ගෙන් ලබා ගත් දත්ත, පාසල් වර්ගීකරණය අනුවත්, ගම්බද/නාගරික වශයෙන් පාසල් වල පිහිටීම අනුවත්, දෙමාපියන්ගේ රැකියා මට්ටම් සහ අධ්‍යාපන මට්ටම් අනුවත්, විශ්ලේෂණය කරනලදි. මෙ හිදී ප්‍රධාන වශයෙන් ප්‍රතිශත ක්‍රමය උපයෝගී කර ගැනිණ. විදුහල්පතිවරුන්ගෙන් ලබාගත් තොරතුරු සහ නිරීක්ෂණ මඟින් ලබාගත් තොරතුරු ඒ ඒ පාසල් අනුව විශ්ලේෂණය කරන ලදි.

## Results Obtained

1 AB වර්ගයේ සහ 3 වර්ගයේ පාසල්වල වැඩි දෙමාපිය සහභාගිත්වයක් පැවති බව පර්යේෂණයෙන් පෙනී ගිය අතර, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳවද පාසලම් අවශ්‍ය භෞතික සම්පත් සැපයීම සම්බන්ධයෙන් ද එම දෙමාපියන් වැඩි උනන්දුවක් දක්වන බව පෙනුණි. දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු සම්බන්ධයෙන් ගම්බද පාසල් වලට දරුවන් එවන දෙමාපියන්ට වඩා නගරබද පාසල් සිසුන්ගේ දෙමාපියන් වැඩි සැලකිල්ලක් දක්වන බව අනාවරණය විය. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට දක්වන උනන්දුව සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සහ රැකියා මට්ටම් බලපාන බව නිගමනය කළ හැකි විය.

දෙමාපියන් පාසලට සහභාගි කර ගැනීමට පාසල් මඟින් යොදා ඇති කළමනාකරණ ක්‍රියා පිළිවෙත් සහ දෙමාපිය සහභාගිත්වය අතර, දැඩි සම්බන්ධයක් පවතින බව පෙනුණි.

පාසල හා දෙමාපියන් අතර, සබඳතාව අඩුවීමට, දෙමාපියන්ගේ ආර්ථික තත්ත්වය, දෙමාපියන්ගේ සමාජ පසුබිම, සහ පාසල් මට්ටමෙන් පවතින දුර්වලතා හේතු සාධක වී ඇති බව පෙනී ගියේය.

පාසල හා දෙමාපියන් අතර, සම්බන්ධතාව වර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමෙන්, කලාපීය මට්ටමෙන් හා ජාතික මට්ටමෙන් ගතහැකි පියවර කිහිපයක් යෝජනා කිරීමට පර්යේෂණය අවසානයේදී හැකි විය.

ජාතික මට්ටමෙන් ගත හැකි පියවර :-

1. දරුවන්ගේ අධ්‍යාපනික වර්ධනය සඳහා දෙමාපියන් සහායවීමේ අවශ්‍යතාව වටහා දීමේ වැඩ සටහන් සම්පාදනය කිරීම.
2. දෙමාපියන් පාසලේ කටයුතු වලට සහභාගි වීම අනිවාර්ය කිරීම.
3. පන්ති මට්ටමේ දෙමාපිය රැස්වීම් අනිවාර්ය කිරීම.
4. තාක්ෂණික විෂයය ඉගැන්වීමේදී දෙමාපියන් ද සහභාගි කර ගැනීම.
5. පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 20-25 අතර සංඛ්‍යාවකට සීමා කිරීම හා අවුරුදු 2-3 අතර, කාලයක් එකම ගුරුවරයා යටතේ පන්ති පවත්වා ගැනීමට නිර්දේශ කිරීම.
6. විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීමේ පුහුණු පාඨමාලා පැවැත්වීම.
7. අධ්‍යාපනය සඳහා ලැබෙන විදේශාධාර දිළිඳු පාසල් වලට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීම සඳහා යෙදවීම.

8. වැඩිහිටියන් සඳහා කාර්ය බද්ධ සාක්ෂරතාව ලබා දීමේ වැඩ සටහන් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දීම.

9. දෙමාපියන් සඳහා ප්‍රජා වැඩ සටහන් සවස් කාලයේ හෝ නිවාඩු දින වල පාසල් තුල ක්‍රියාත්මක කරවීම.

10. දිළිඳු ජන කොටස් සඳහා රාජ්‍ය මට්ටමෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

කළාපිය මට්ටමෙන් ගත හැකි පියවර :-

1. දෙමාපියන් දැනුවත් කිරීම.
2. කළාප මට්ටමෙන් ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීමේදී ඔවුන් දෙමාපියන් සමග පවත්වන සබඳතා ගැන ද සැලකිලිමත් වීම.
3. අධ්‍යාපන අමාත්‍යාංශයේ නොනිධිමත් අධ්‍යාපන ශාඛාව මගින් වැඩිහිටියන් සඳහා සංවිධානය කෙරෙන කාර්යබද්ධ සාක්ෂරතා වැඩ සටහන් පිළිබඳව පළාත් අධ්‍යාපන කාර්යාලයෙන් ලැබෙන උපදෙස් අනුව ක්‍රියා කිරීම.

පාසල් මට්ටමෙන් ගත හැකි පියවර :-

1. පාසලේ පැවැත්වෙන මාපිය රැස්වීම් ක්‍රමවත්ව සංවිධානය කිරීම.
2. දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම.
3. ප්‍රාථමික අධ්‍යාපනය ලබන ගුරුවරුන්ගේ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය යටිතල පහසුකම් ලබාගැනීම සඳහා දෙමාපියන් සහාය කර ගැනීම.
4 4. පන්ති මට්ටමේ මාපිය රැස්වීම් පාසල් වාරයකට එක බැගින් පැවැත්වීම.
5. පාසලේ කාර්යයන් සඳහා දෙමාපියන් ක්‍රියාකාරී ලෙස සහභාගි කර ගැනීම.
6. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දෙමාපිය සහාය ලබා ගැනීම.
7. දරුවන්ගේ ඉගෙනුම් ප්‍රගතිය පිළිබඳව පාසල් වාරයකට වරක්වත් දෙමාපියන් දැනුවත් කිරීමට පියවර ගැනීම.
8. දෙමාපියන් පාසලට සහභාගි කරගත හැකි අවස්ථා වැඩි කිරීම.
9. පාසලේ විශේෂ අවස්ථා සංවිධානය කිරීමේදී දෙමාපියන්ට වගකීම් පැවරීම.
10. වැඩිහිටියන් සඳහා සැලසුම් කරන ලද කාර්යබද්ධ සාක්ෂරතා වැඩසටහන් පැවැත්වෙන මධ්‍යස්ථාන වලට දෙමාපියන් යොමු කිරීම.
11. වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු සඳහා දෙමාපියන් සහභාගි කර ගැනීම.

12. දෙමාපියන්ට ප්‍රයෝජනවත් වන ප්‍රජා සේවා වැඩ සටහන් පාසල තුළ පැවැත්වීම

13. දෙමාපිය සහභාගිත්වයෙන් දරුවන්ගේ සාරධර්ම වර්ධනයට තුඩු දෙන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

ඉහත දැක්වූ යෝජනා වලට අමතරව අනාගතයේදී පර්යේෂණයට භාජනය විය යුතු ක්ෂේත්‍ර කිහිපයක්ද හඳුන්වා දෙමින් පර්යේෂණ කාර්යය නිම කෙරිණි.